# සතියේ සාකච්ඡාව

## සමාජය හා සාමයික කේන්ද්‍රයේ මාධ්‍ය ඒකකය

සමාජය හා සාමයික කේන්ද්‍රය
சமய சமூக நடுநிலையம்
Centre for Society & Religion

# (Brexit) බ්‍රිතාන්‍ය යුරෝපයෙන් ඉවත්වීම හෙවත් ධනපති ක්‍රමය නායයාම



ප්‍රභාත් ලංකාලෝක විසිනි
2016 ජුනි 30

2016 ජුනි 23 දින බ්‍රිතාන්‍ය යුරෝපා සංගමයෙන් ඉවත්වනවාද නැද්ද යන්න තීරණය කිරීම සඳහා පැවති ජනමත විචාරණයෙන් එය ඉවත් විය යුතුය යන මතය ජයග්‍රහණය කළේය. මෙම ජනමත විචාරණයේදී 72.21% ඡන්දය භාවිතා කොට තිබූ අතර ඉන් 51.89% ක් හෙවත් 17, 410, 742 ක් යුරෝපා සංගමයෙන් ඉවත් විය යුතු බවටත් 48.11% ක් හෙවත් 16, 141, 241 ක් තවදුරටත් එහි රැඳී සිටිය යුතු බවටත් ඡන්දය ප්‍රකාශ කොට තිබුණි.

මෙය ලෝක ධනේශ්වර ක්‍රමය බරපතල ලෙස කම්පනය කළ සිදුවීමක් විය. ජනමත විචාරණයට පෙර $1.50 ක් ලෙසින් පැවති ස්ටර්ලින් පවුම ජනමත විචාරණයෙන් පසුව ක්ෂණිකව $1.35 පමණ දක්වා 11% කින් පමණ පහත වැටුණි. බ්‍රිතාන්‍ය කොටස් වෙළඳපොල 3.1% කින් පහළ වැටුණි. ලොවපුරා වෙළඳපොල වලින් ඩොලර් ට්‍රිලියන 2 ක් (කෝටි 20,000 ක්) පමණ වටිනාකම් ක්ෂණිකව වියැකී ගියේය.

ලංකාව තුළද දේශපාලනඥයන් ඇතුළු විවිධ අය මේ සම්බන්ධව ඉතා දැඩි අවධාරණයක් යොදනු දැකිය හැකි විය. බ්‍රිතාන්‍ය යුරෝපා සංගමයෙන් ඉවත්වීම හේතුවෙන් ඇතිවිය හැකි ආර්ථික අපහසුතා මගහරවා ගැනීමට ඉන්දියාව සමඟ එට්කා (ETCA) ගිවිසුමට ඉක්මණින් එළඹීම පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා චීනයේ සංචාරයක යෙදෙමින් සිටින ජාත්‍යන්තර වෙළඳ ඇමති මලික් සමරවික්‍රම මහතා චීනයේ සිට ඉන්දියාව බලා යන බවත්, ඉන්දියාවට පැමිණෙන මලික් සමරවික්‍රම මහතා සමඟ එක්වීමට අගමැති ජොෂ්ඨ උපදේශක ආර්. පාස්කරලිංගම් ඇතුළු කණ්ඩායමක්ද අගමැතිවරයාගේ උපදෙස් මත ඉන්දියාවට යන බවත් 2016-06-28 දිවයින පුවත්පත විසින් වාර්තාකොට තිබුණි.

ලංකාව යුරෝපා සංගමයට කරනු ලබන අපනයනවලින් 40% ක් පමණ යවනු ලබන්නේ බ්‍රිතාන්‍යයටය. මෙතෙක් යුරෝපා සංගමය ලංකාවෙන් සිදුකරන ආනයන සම්බන්ධයෙන් ගනු ලබන තීරණ වලින් බ්‍රිතාන්‍ය බැඳී සිටියේය. එහෙත් ඉදිරියේදී බ්‍රිතාන්‍ය යුරෝපා සංගමයෙන් වෙන්වීමෙන් පසු ලංකාවෙන් සිදුකරන ආනයන සම්බන්ධයෙන් අනුගමනය කරන පිළිවෙත මේ දක්වා අපැහැදිලිය. එමෙන්ම ඉදිරියේදී යුරෝපා සංගමය ලංකාවට ලබාදීමට නියමිත GSP+ වැනි සහනයන් සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය අනුගමනය කරන පිළිවෙතද අපැහැදිලිය. මේ නිසා ලංකාවේ ව්‍යාපාරික කොටස් තුළද මෙම වෙන්වීම ගැන යම් කම්පනයක් ඇතිවීම ස්වාභාවිකය.

ධනපති ක්‍රමය විසින් එහි මුල් කාලයේදීම ජාතික රාජ්‍ය ගොඩනැගීය. ඒ හරහා ඊට පෙර වැඩවසම් අධිපතීන් යටතේ පැවති ප්‍රාදේශීය පාලනයන්ට වඩා බෙහෙවින් පුළුල් හා පොදු නීතිරීති යටතේ පාලනය වන වෙළඳපොලක් බිහි විය. එහෙත් ආරම්භයේ සිටම ධනපති ක්‍රමයට ජාතික රාජ්‍ය සීමාවන් තුළට තම නිෂ්පාදන ක්‍රියාවලිය සීමාකළ නොහැකි විය. ඔවුනට ලෝකයේ විවිධ ප්‍රදේශවලින් අමුද්‍රව්‍ය සපයාගත යුතු වූ අතර තම කර්මාන්තශාලා වලින් මහා පරිමාණයෙන් පිටවන නිමි භාණ්ඩ ලෝකයේ විවිධ ප්‍රදේශවල විකුණාගත යුතු විය. මෙම ක්‍රියාවලිය සඳහා ලෝකයේ විවිධ ප්‍රදේශවල විවිධාකාර ආයෝජන සිදුකළ යුතු විය. මේ හරහා ධනපති ක්‍රමය විසින් ලෝක පරිමාණ ජාත්‍යන්තර නිෂ්පාදන රටාවක්ද බිහි කළේය.

ජාතික රාජ්‍ය විසින් තම දේශපාලන වුවමනාවන් වෙනුවෙන් පනවනු ලබන අයබදු, තීරුබදු ආදී බදු ක්‍රම හා අනෙකුත් මුල්‍ය රෙගුලාසි ඉහත කී ලෝක පරිමාණ ජාත්‍යන්තර නිෂ්පාදන ක්‍රමයට බාධා පමුණුවයි. එම සීමාවන් විසින් අමුද්‍රව්‍ය මිල ඉහළ දමයි. නිමි භාණ්ඩවල මිලද ඉහළ දමයි. වෙළඳාමට සීමා පමුණුවයි. දේශපාලන වශයෙන් ධනපති ක්‍රමය සංවිධානය වී ඇති ජාතික රාජ්‍ය හා ආර්ථික වශයෙන් ධනපති ක්‍රමය ක්‍රියාත්මක කරන ලෝක පරිමාණ ජාත්‍යන්තර නිෂ්පාදන ක්‍රමය අතර ඇති ගැටුම ධනපති ක්‍රමය තුළ දැකිය හැකි එක් නිසඟ ප්‍රතිවිරෝධයකි.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව ජාත්‍යන්තර වෙළඳාම ඉතා වේගයෙන් වර්ධනය විය. 1913 සිට 1948 දක්වා ජාත්‍යන්තර වෙළඳ කටයුතු (International Commerce) වර්ධනය වූයේ වාර්ෂිකව 0.5% ක සාමාන්‍ය වේගයකිනි. එහෙත් 1973 සිට 1948 දක්වා කාලය තුළ එය වාර්ෂිකව 7% ක වේගයකින් වර්ධනය විය. වටිනාකම වශයෙන් ගත්කළ 1947 දී ඩොලර් බිලියන 57 ක් වූ ලෝක වෙළඳාම 1990 ගණන් වනවිට ඩොලර් ට්‍රිලියන 6 ක් (බිලියන 6,000 ක්) දක්වා ඉහළ ගොස් තිබුණි. නිෂ්පාදිත භාණ්ඩ වලට අමතරව (බැංකු කටයුතු, තොරතුරු තාක්ෂණ පහසුකම් ආදියද ඇතුළත්) සේවා කටයුතුද මෙම කාලය තුළ බෙහෙවින් වර්ධනය විය.

දෙවන ලෝක යුද්ධයෙන් පසු ඇති කරගත් විවිධ සම්මුතීන් හරහා ලෝක වෙළඳාමට පැවති බාධාවන් ඉවත් කර දැමීම ජාත්‍යන්තර වෙළඳාම මෙසේ වර්ධනය වීමට බලපෑ එක් හේතුවක් විය. 1950 පමණ වනවිට අමෙරිකාව ඇතුළු දියුණු ධනේශ්වර රටවල් ආනයන සඳහා පනවන තීරුබදුවල සාමාන්‍ය පැවතියේ 40% පමණ මට්ටමකය. මීළඟ වසර 50ක කාලය තුළ එය 6% පමණ දක්වා අඩුවීම ධනපති ලෝකය විසින් වෙළඳාමට තිබූ බාධක ඉවත්කිරීම වෙනුවෙන් ගත් ක්‍රියා මාර්ගයන්ට උදාහරණයකි. එසේ වුවද මෙම කාලය ජාත්‍යන්තර වෙළඳාමේ වර්ධනයට සමගාමීව ජාත්‍යන්තර තරඟකාරීත්වයද බෙහෙවින් ඉහළ ගිය කාලයක්ද විය.

යුරෝපා සංගමයේ කලල රූපය ඇතිවන්නේ මෙම පසුබිම තුළදීය. 1951දී ප්‍රංශය, බටහිර ජර්මනිය, ඉතාලිය, බෙල්ජියම, නෙදර්ලන්තය හා ලක්සම්බර්ග් යන රටවල් 6 එකතුව ගොඩනඟාගත් යුරෝපීය ගල් අඟුරු හා යකඩ හවුල (European Coal and Steel Community – ECSC) එම කලලයයි. රූර් ප්‍රදේශයේ යපස් නිධි ලෝක යුද්ධ දෙකේදීම බලවත් සාධකයක් වීම නිසා ලෝක යුද්ධයෙන් පසු යුරෝපය නැවත ගොඩනැගීම වෙනුවෙන් අවශ්‍යම වූ භාණ්ඩ දෙකක් වූ ගල් අඟුරු හා යකඩ සඳහා නැවත ඔවුනොවුන් අතර තරඟකාරීත්වයක් ඇතිකර නොගෙන ඒවා නිෂ්පාදනය හා බෙදාහැරීම වෙනුවෙන් සහයෝගීතාවයක් ඇතිකර ගැනීම මෙහි අරමුණක් විය.

වැඩිකල් නොගොස් එක් අතකින් ඒ වනවිට පැවති සමාජවාදී කඳවුරෙන් එල්ලවන තර්ජනයට හා අනෙක් අතින් ඒ වනවිට ධනේශ්වර ලෝකයේ මහ බලවතා බවට පත්ව සිටි අමෙරිකාව හා දෙවන ලෝක යුද්ධයෙන් පසු වේගවත් වර්ධනයක් ලබා ගනිමින් සිටි ජපානය වැනි ධනේශ්වර කඳවුර තුළින්ම මතුවන තරඟකාරීත්වයටද මුහුණ දෙමින් එකිනෙකා අතර වෙළඳාම වර්ධනය කරගැනීමේ අවශ්‍යතාවය එම රටවල් විසින් වටහා ගත් අතර ඒ වෙනුවෙන් 1957දී රෝමයේදී අත්සන් කළ එකඟත්වයක් අනුව ECSC හවුලේ රටවල් 6 විසින්ම යුරෝපා ආර්ථික හවුල (European Economic Community – EEC) පිහිටුවා ගනු ලැබුණි. එයට සමගාමීව 1957දීම යුරෝපය තුළ පරමාණු බලශක්තිය භාවිතා කිරීමට අදාලව එම රටවල් හයේම මූලිකත්වයෙන් යුරෝපා පරමාණු බලශක්ති හවුලද (European Atomic Energy Community – EAEC) පිහිටවනු ලැබිය. 1959දී EEC රටවල් විසින් එකිනෙකා අතර ආනයන තීරුබදු 10% දක්වා පහත හෙළන ලදී.

මෙසේ යුරෝපයේ රටවල් 6ක් ආර්ථික සහයෝගීතාවයක් කරා ගමන් කරත්ම යුරෝපයේම සිටි තවත් රටවල් 7ක් නෝර්වේ, ස්වීඩනය, ස්විට්සර්ලන්තය, ඩෙන්මාර්කය, ඔස්ට්‍රියාව, අයිස්ලන්තය හා පෘතුගාලය එකතුව 1960 සිට යුරෝපීය නිදහස් වෙළඳ හවුල (European Free Trade Association – EFTA) ගොඩනඟා ගන්නා ලදී. 1960 වනවිටම යුරෝපයේ රටවල් හවුල් දෙකක් වශයෙන් ගොඩනැඟී තිබුණේ ඔවුන් අතර පැවති දේශපාලන වෙනස්කම් නිසාවෙනි. මුල පටන්ම යුරෝපයේ රටවල් අතර පැවති දේශපාලන ආතතීන් මෙයින් පැහැදිලිය.

| මුල් කාලයේ කාර්මික රටවල් අතර වෙළදාමේ ප්‍රතිශතය | 1956-58 | 1962-64 | 1968-70 |
|---|---|---|---|
| EEC රටවල් | | | |
| EEC රටවල් සමඟ | 44.1 | 53.4 | 60.8 |
| EFTA රටවල් සමඟ | 29.7 | 25.6 | 19.8 |
| අනෙකුත් කාර්මික රටවල් සමඟ | 26.2 | 21.0 | 19.4 |
| EFTA රටවල් | | | |
| EEC රටවල් සමඟ | 36.4 | 40.2 | 38.0 |
| EFTA රටවල් සමඟ | 27.1 | 29.1 | 32.3 |
| අනෙකුත් කාර්මික රටවල් සමඟ | 36.5 | 30.7 | 29.7 |

EEC රටවල් අතර වෙළදාම ඉතා වේගයෙන් වර්ධනය වන්නට වීම නිසා 1967දී ECSC, EAEC හා EEC ආයතන තුන ඒකාබද්ධ ව්‍යුහයක් තුළට ඒකරාශී කරමින් යුරෝපීය හවුල (European Communities – EC) ස්ථාපිත කරන ලදී. 1968දී එය විසින් සාමාජික රටවල් 6 අතර ආනයන තීරුබදු අහෝසි කරන ලදී. පසුව 1973දී බ්‍රිතාන්‍යය, අයර්ලන්තය හා ඩෙන්මාර්කයද, 1981දී ග්‍රීසියද, 1995දී ස්වීඩනය, පින්ලන්තය හා ඔස්ට්‍රියාවද මෙම හවුලේ සමාජිකත්වයට ඇතුළු කර ගැණිනි.

1973–1975 හා 1978–1979 කාලවල ලෝක ධනපති ක්‍රමය දැවැන්ත අවපාතයක් කරා ගමන් කිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් ලෝක ධනපති ක්‍රමය ඒ වනවිට ක්‍රියාත්මක කළ (රජය මැදිහත් වී සිදුකරන මහා පරිමාණ සුභසාධනවාදී හා අනෙකුත් ව්‍යාපෘති වෙනුවෙන් කරන වියදම් හරහා ආර්ථිකය දිවවීම වැනි) කෙන්සියානුවාදී ක්‍රියාමාර්ග අතහැර මුලායවාදී හෙවත් නව ලිබරල්වාදී ප්‍රතිපත්ති කරා ගමන් කරන්නට විය. ඒ සමඟම ධනපති ලෝකයේ සෑම රටක්ම පාහේ මූල්‍ය ප්‍රාග්ධනය නිදහසේ ගලායාමට තිබූ බාධක ඉවත් කර වෙළඳපොල (විශේෂයෙන් මූල්‍ය වෙළඳපොල) වර්ධනය සඳහා පහසුකම් සලසන්නට විය.

නව ලිබරල්වාදයේ මූලික ලක්ෂණ

- **වෙළඳපොල පාලනයන් ඉවත්කොට වෙළඳපොළට නිදහස්ව හැසිරීමට ඉඩදීම හා වෙළඳපොල බලවේගවලට සමස්ත සමාජය පාලනය කිරීමට ඉඩදීම :** මේ වෙනුවෙන් ජාත්‍යන්තර වෙළඳාමට හා ආයෝජනයන්ට වඩා වැඩි ඉඩකඩක් හා නිදහසක් ලබාදීම, දශක ගණනාවක් පැවති කම්කරු අයිතිවාසිකම් ඉවත් කරමින් ප්‍රාග්ධනයට රිසිසේ ශ්‍රමය සූරා කෑමට ඉඩ ලබාදීම, මිල හා පාලනයන් ඉවත් කිරීම ආදිය සිදු කරන ලදී.
- **සමාජ සුභසාධනයන් හා පොදු සේවාවන් සඳහා රජය විසින් සිදුකළ වියදම් කප්පාදු කිරීම :** සෞඛ්‍ය, අධ්‍යාපනය, ජලය, මහාමාර්ග වැනි පොදු සේවාවන් සඳහා රජය සිදුකළ වියදම් කපා දැමීම, නොමිලේ භාවිතා කළහැකි මහාමාර්ග වෙනුවට මුදල් ගෙවා ගමන් කරන මාර්ග (toll roads) ඇතිකිරීම මේ වෙනුවෙන් සිදු කරන ලදී.
- **ආයෝජනය කිරීම, ලාභ ලැබීම හා වෙළඳපොල පාලනය වෙනුවෙන් රජය විසින් පනවා ඇති සියළු නීතිරීති ඉවත් කිරීම හෝ ඒවා බෙහෙවින්ම ලිහිල් කිරීම.**
- **පුද්ගලීකරණය :** රජයේ පාලනය යටතේ පැවති බැංකු, රෝහල් හා අනෙකුත් ලාභ ලබන ව්‍යවසාය පුද්ගලික අංශය වෙත පවරා දීම.
- **“පොදු යහපත”, “සමාජ වුවමනාව” වැනි සංකල්ප ඉවත් කර ඒ වෙනුවට “පුද්ගලික වගකීම” යන සංකල්පය ඉදිරියට ගැනීම :** දිළිඳුම ජනයාට පවා තම සෞඛ්‍ය, අධ්‍යාපනය හා නිවාස වැනි දේ ලබාගැනීම වෙනුවෙන් රජයෙන් ආධාර බලාපොරොත්තු නොවී ඒ වෙනුවෙන් තමන්ම විසඳුම් ලබාගත යුතුය යන මතවාදය සමාජය තුළ තහවුරු කරන ලදී.

මෙම වෙනස්කම් සමඟම මූල්‍ය වෙළඳපොල වේගයෙන් ප්‍රසාරණය වන්නට විය. 1990 වනවිට විදේශ මුදල් වෙළඳාම (විවිධ මුදල් මිලදී ගැනීම හා විකිණීම) දිනකට ඩොලර් ට්‍රිලියන 1.5 ක් දක්වා වැඩිවී තිබුණි. මෙය 1986 ට සාපේක්ෂව අට ගුණයක ඉහළ යාමකි. මෙම කාලය තුළ ලෝකයේ භාණ්ඩ හා සේවා වෙළඳාමට වඩා වැඩියෙන් මූල්‍ය වෙළඳපොල වර්ධනය විය. 1997 වනවිට දිනකට වෙළඳාම් වුණු භාණ්ඩ හා සේවා වල වටිනාකම ඩොලර් බිලියන 25 ක් (1997 මුළු වසරේදීම එය ඩොලර් ට්‍රිලියන 6.6 ක්) පමණක් වීමෙන් ඒ බව පැහැදිලි වේ. 1990 ගණන් වනවිට විශ්‍රාම අරමුදල් (Pension Funds), අන්‍යෝන්‍යාධාර අරමුදල් (Mutual Funds) ආදිය ඩොලර් ට්‍රිලියන 20 දක්වා වැඩිවී තිබුණි. මෙය 1980 ට සාපේක්ෂව දස ගුණයක වැඩිවීමකි.

මූල්‍ය වෙළඳපොලවල වූ මෙම දැවැන්ත වර්ධනය ව්‍යාජ හා කෘතිම වර්ධනයක් විය. මෙය කොතරම් ව්‍යාජ ප්‍රසාරණයක් වීද යත් මෙම කාලයේ සමස්ත ලෝකයේ පැවති මූල්‍ය ප්‍රාග්ධනය ඩොලර් ට්‍රිලියන 360 ක් ලෙස ගණන් බලා තිබුණි. මෙය ලෝකයේ මුළු ආර්ථික වටිනාකමටද වඩා වැඩි අගයකි. මූල්‍ය වෙළඳපොලේ සිදුවූ මෙම ව්‍යාජ ප්‍රසාරණය නිසා ධනපති ක්‍රමය තව තවත් අස්ථාවර වන්නට විය. එසේ වුවද මූල්‍ය වෙළඳපොලේ සිදුවූ මෙම වර්ධනයන් නිසා රටවල් අතර වඩා වැඩි ඒකාබද්ධවීම් අවශ්‍ය වූ අතර මූල්‍ය ප්‍රග්ධනයේ වර්ධනය වෙනුවෙන් එවන් ඒකාබද්ධවීම් කරා ධනපති ලෝකය ගමන් කළේය. 1989 බර්ලින් තාප්පය කඩා දැමීමෙන් ඇරඹි නැගෙනහිර යුරෝපයේ පැවති සැළසුම්ගත ආර්ථිකයන් බිඳවැටීමත්, 1991 සෝවියට් සංගමය බිඳවැටීමත් නිසා වැඩි විශ්වාසයක් ඇතිකරගත් යුරෝපානු ධනපති ක්‍රමය 1992දී මාස්ට්‍රිච් ගිවිසුම කරා යමින් පොදු මුදල් ඒකකයක් ගොඩනඟා ගැනීම දක්වාද ගමන් කළේය. මෙම වෙනස්කම් සමඟ යුරෝපා හවුල (European Communities) යුරෝපා සංගමය (European Union) ලෙසින් හැඳින්වෙන්නට විය.

1960 ගණන් වලදී රටවල් එකතු වෙමින් පොදු වෙළඳපොලවල් ගොඩනඟා ගැනීමේ තවත් උත්සාහයන් අපට දැකිය හැකි විය. 1960 ඇතිකළ මධ්‍යම අමෙරිකානු පොදු වෙළඳපොල, 1967 දකුණු ආසියානු රටවල් එකතුව ගොඩනගාගත් ආසියාන් (ASEAN) සංවිධානය එයට උදාහරණයන්ය. එහෙත් ජාතික රාජ්‍ය හා ජාත්‍යන්තර නිෂ්පාදන ක්‍රමය අතර ඇති ගැටුම නිසාවෙන් ඒවා ගමන් කළ දුර සීමාසහිත විය. එහෙත් ලෝකයේ කාර්මික බලවතුන් වූ යුරෝපයට අමෙරිකාවෙන්, ජපානයෙන් හා නැඟී එන ආසියාතික රටවලින් එල්ලවූ දැඩි තරඟකාරීත්වය හමුවේ වඩාත් වැඩි ඒකාබද්ධතාවයන් කරා යමින් වෙළඳපොල පුළුල් කරගැනීමේ වුවමනාවක් පැවතීම නිසා යුරෝපා සංගමය ලෝකයේ ගොඩනැඟුණු අනෙක් පොදු වෙළඳපොල වලට වඩා වැඩි දුරක් ගමන් කළේය. එය පොදු ව්‍යවස්ථාදායකයක් (යුරෝපා පාර්ලිමේන්තුව හා යුරෝපා කවුන්සිලය), පොදු විධායකයක් (යුරෝපා කොමිසම), පොදු අධිකරණයක්, යුරෝපීය මහ බැංකුවක් හා පොදු මුදල් ඒකකයක් ඇතිකර ගත්තේය.

එසේ වුවද යුරෝපා සංගමයට සම්බන්ධ රටවල් එකිනෙකා අතර සහයෝගය පවත්වා ගැනීමේ අති විශාල විෂමතා පවතී. යුරෝපා සංගමය, යුරෝ කලාපය, යුරෝපා රේගු කලාපය, පොදු වීසා කලාපය (Schengen Area) ආදී වශයෙන් යුරෝපා පොදු වෙළඳපොල හා සම්බන්ධ විවිධ යන්ත්‍රණයන්ට විවිධ රටවල් දායක වී ඇත්තේ බොහෝ වෙනස් ලෙසිනි. බ්‍රිතාන්‍ය යුරෝපා සංගමයේ සාමාජිකයෙක්ව සිටියද පොදු මුදල් ඒකකයට හෝ පොදු වීසා කලාපයට (Schengen Area) සම්බන්ධ වූයේ නැත. නෝර්වේ හා ස්විට්සර්ලන්තය වැනි තවත් රටවල් යුරෝපා සංගමයේ සාමාජිකත්වය ලබා නැති මුත් පොදු වීසා කලාපයට (Schengen Area) සම්බන්ධව සිටී. යුරෝපා සංගමයේ සාමාජිකයන් වන ස්වීඩනය, ඩෙන්මාර්කය හා පින්ලන්තය යුරෝපා සංගමයේ සාමාජිකයන් නොවන නෝර්වේ හා අයිස්ලන්තය හා එක්ව නෝර්ඩික් (Nordic) සන්ධානය පවත්වාගෙන යයි. මෙම විෂමතාවයන්ට මූලිකම හේතුව ජාතික රාජ්‍යවල ඇති වෙනස් දේශපාලන වුවමනාවන්ය.



උපුටා ගැනීම : Wikipedia වෙතින්

බ්‍රිතාන්‍ය යුරෝපා සංගමයෙන් වෙන්වීමට මූලික ලෙසින්ම බලපෑවේ ආර්ථික කරුණු නොවන බව පැහැදිලිය. බ්‍රිතාන්‍යයේ භාණ්ඩාගාර ප්‍රධානී විසින් 2016 අප්‍රේල් මස එරට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ “HM Treasury Analysis : The long term impact of EU membership and the alternatives” නම් වාර්තාව තම නිගමනය වශයෙන් දක්වා ඇත්තේ කුමන විකල්පයක් අනුගමනය කළද යුරෝපීය සංගමයෙන් ඉවත්වීම බ්‍රිතාන්‍යයට ආර්ථික වශයෙන් බරපතල අන්දමින් අවාසිදායක බවයි. එම වාර්තාවට අනුව බ්‍රිතාන්‍ය යුරෝපා සංගමයට එකතු වීමෙන් පසු සැළකිය යුතු ආර්ථික ප්‍රගතියක් අත්කරගෙන ඇත. යුරෝපා සංගමයට එකතු වීමට පෙර බ්‍රිතාන්‍යයේ වෙළඳාම ජාතික ආදායමින් 30%ට පහළින් පැවති බවත් යුරෝපා සංගමය සමඟ සිටි අවසන් දශකය තුළ එය 60%ට වැඩිවී ඇති බවත් එම වාර්තාව පෙන්වා දෙයි. යුරෝපය තනි වෙළඳපොලක් ලෙසට වෙළඳාම සඳහා යන වියදම් අඩුකොට තිබීම එම වෙළඳාමේ වර්ධනයට ප්‍රධාන හේතුව බවත් යුරෝපා සංගමය නොතිබුණේ නම් රේගු බදු ඇතුළුව වෙළඳාම සඳහා යන වියදම දෙතුන් ගුණයකින් ඉහළ යාමට ඉඩ තිබූ බවත් එම වාර්තාව පෙන්වා දෙයි.

එම වාර්තාවට අනුව පසුගිය කාලය තුළ බ්‍රිතාන්‍ය ආයෝජන සඳහා ආකර්ශනයක් ලබාගත්තේත් සෘජු විදේශ ආයෝජන (FDI) අතින් ඉහළටම පැමිණියේත් යුරෝපා සංගමයෙන් ලැබෙන වාසිය නිසාය. විදේශ ආයෝජකයින්ගෙන් 75%ක් පමණම තමන් බ්‍රිතාන්‍ය තුළ ආයෝජනය කිරීමට හේතුව ලෙස දක්වා තිබුණේ එයට යුරෝපා වෙළඳපොලට පිවිසීමට ඇති හැකියාව බවද එම වාර්තාව දක්වා තිබුණි. එසේම බ්‍රිතාන්‍යයේ මුළු අපනයන්ගෙන් 44%ක් යුරෝපා සංගමයේ රටවලට සිදුකරන බවත් බ්‍රිතාන්‍ය තුළ එම අපනයනවලට සම්බන්ධ රැකියා මිලියන 3.3ක් පවතින බවත් එම වාර්තාව වැඩි දුරටත් දක්වා තිබුණි. බ්‍රිතාන්‍ය දළ දේශීය නිශ්පාදිතයෙන් 12.6%ක් යුරෝපා සංගමයට කරනු ලබන අපනයන මත රඳා පවතින බවද එම වාර්තාව දක්වා තිබුණි.

වෙන්වීමෙන් පසු වියහැකි විකල්පයන් සම්බන්ධයෙන් එම වාර්තාව දක්වා තිබුණේ මෙසේය. "පළල්ව පිළිගත් අදහස්වලට අනුව යුරෝපා සංගමයෙන් බැහැරවීම යන්නෙන් අදහස් කරන්නේ පහතින් දැක්වෙන මාදිලිවලින් එක් ආකාරයක සම්බන්ධතා කරා ගමන් කිරීමයි.

- නෝර්වේ මෙන් යුරෝපා ආර්ථික ප්‍රදේශයේ (EEA) සාමාජිකයෙක් ලෙස කටයුතු කිරීම
- ස්විට්සර්ලන්තය, තුර්කිය හා කැනඩාව මෙන් ද්විපාර්ශවික ගිවිසුම් ඇතිකර ගැනීම
- යුරෝපා සංගමය සමඟ නිශ්චිත එකඟත්වයකින් තොරව ලෝක වෙළඳ සංවිධානයේ (WTO) සාමාජිකයෙක් ලෙස කටයුතු කිරීම"

| එක් එක් විකල්පය යටතේ වසර 15කදී බ්‍රිතාන්‍යයේ හැකි ආර්ථික තත්ත්වය | EEA සාමාජිකයෙක් ලෙස කටයුතු කිරීම | ද්විපාර්ශවික ගිවිසුම් ඇතිකර ගැනීම | WTO සාමාජිකයෙක් ලෙස කටයුතු කිරීම |
|---|---|---|---|
| GDP මට්ටම (%) - සාමාන්‍ය | -3.8 | -6.2 | -7.5 |
| GDP මට්ටම (%) | -3.4 සිට -4.3 | -4.6 සිට -7.8 | -5.4 සිට -9.5 |
| ඒක පුද්ගල GDP - සාමාන්‍ය (පවුම්) | -1,100 | -1,800 | -2,100 |
| ඒක පුද්ගල GDP (පවුම්) | -1,000 සිට -1,200 | -1,300 සිට -2,200 | -1,500 සිට -2,700 |
| නිවසක GDP - සාමාන්‍ය (පවුම්) | -2,600 | -4,300 | -5,200 |
| නිවසක GDP (පවුම්) | -2,400 සිට -2,900 | -3,200 සිට -5,400 | -3,700 සිට 6.600 |
| ලැබීම් සඳහා වියහැකි ශුද්ධ බලපෑම | පවුම් බිලියන -20 | පවුම් බිලියන -36 | පවුම් බිලියන -45 |

බ්‍රිතාන්‍ය භාණ්ඩාගාර ප්‍රධානීගේ වාර්තාවට අනුව ඉහත කුමන විකල්පය තෝරා ගනු ලැබුවද යුරෝපා සංගමයෙන් ඉවත්වීම නිසා බ්‍රිතාන්‍ය බරපතල ආර්ථික අවාසියකට මුහුණ දෙනු ඇත.

පැවති ජනමත විචාරණයේදී යුරෝපා සංගමයෙන් ඉවත්විය යුතුය යනුවෙන් හඬ නැඟූ බොහෝ දෙනෙකු විසින් දැක්වූ ප්‍රධානතම කරුණ වූයේ සංක්‍රමණික ගැටළුවයි. ඔවුන් කියා සිටියේ බ්‍රිතාන්‍යයට පැමිණෙන සංක්‍රමණිකයන් නිසා බ්‍රිතාන්‍යයන්ගේ රැකියා නැති වන බවයි. බ්‍රිතාන්‍යය දරුවන්ට පාසැල් අවස්ථා අඩුවන බවයි. සෞඛ්‍ය වැනි පොදු පහසුකම් සඳහා වෙන්කරන මුදලින් විශාල කොටසක් සංක්‍රමණිකයන් සඳහා වැය වන බවයි. ඔවුන් කියා සිටියේ තම දේශසීමා පාලනය සම්බන්ධයෙන් බ්‍රිතාන්‍යයට වැඩි ඉඩක් පැවතියේ නම් එම සංක්‍රමණිකයන්ගේ පැමිණීම පාලනය කළ හැකිව තිබුණු බවයි.

තම බලය ව්‍යාප්ත කිරීමේ අරමුණින් අධිරාජ්‍යවාදී රටවල් විසින් මැද පෙරදිග ඉරාකය, ලිබියාව, සිරියාව, ඇෆ්ගනිස්ථානය හා යේමනය වැනි රටවල් සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර නිසාවෙන් එම සෑම රටක්ම මේ වනවිට ඉතා දරුණු යුද්ධයන්ට ගොදුරුවී ඇති අතර එම යුද්ධවලින් ජීවිතයට තර්ජන එල්ලවී ඇති, වාසස්ථාන හා දේපළ අහිමිවන ජනතාව ජීවත්වීමට අන් මඟක් නොමැති නිසා දස දහස් ගණනින් ආසන්නයේ ඇති යුරෝපා රටවලට පැමිණෙන්ට වීම නිසා මෑත කාලය තුළ යුරෝපයේ සංක්‍රමණිකයන් සම්බන්ධ බරපතල ගැටළු මතුවූ බව අපි දනිමු. 2014දී රැකවරණ පතා යුරෝපයට ඇතුළුවීම අපේක්ෂාවෙන් අයදුම්පත් 626,065ක් ඉදිරිපත් කර තිබූ අතර 283,532ක් අනවසරයෙන් යුරෝපයට ඇතුළු වී තිබිණි. 2015දී රැකවරණ පතා යුරෝපයට ඇතුළුවීම අපේක්ෂාවෙන් ඉදිරිපත් කළ අයදුම්පත් ගණන 1,255,640ක් වී තිබූ අතර (මින් අනුමත වී තිබුණේ 292,540ක් පමණි) දශ ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් අනවසරයෙන් යුරෝපයට ඇතුළු වී තිබුණි. ඔවුන් මෙසේ පැමිණ තිබුණේ අති දුෂ්කර ක්‍රම අනුගමනය කරමින් තම ජීවිත පරදුවට තබමිනි. එම දුෂ්කරකම කෙතරම්ද යත් 4,000ක් පමණ දෙනා එම ගමන අතරතුර මියගොස් තිබුණි. මෙය මෑත ඉතිහාසයේ සිදුවූ විශාලතම මිනිස් සංක්‍රමණයක් වූ අතර විශාලතම මිනිස් ඛේදවාචකයක්ද විය. බටහිර අධිරාජ්‍යවාදීන් මෙම ඛේදවාචකයකයට ඍජුවම වගකිව යුතු විය.

2014 -16 කාලය තුළ රැකවරණ පතා යුරෝපයට ඇතුළු වූ අය වෙනුවෙන් යුරෝපා සංගමයේ රටවලට දැරීමට ඇති වියදම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස

| | 2014 | 2015 | 2016 |
|---|---|---|---|
| ඔස්ට්‍රියාව | 0.08 | 0.16 | 0.31 |
| බෙල්ජියම | 0.07 | 0.09 | 0.11 |
| ක්‍රෝඒෂියාව | 0.002 | 0.09 | 0.11 |
| සයිප්‍රසය | 0.003 | 0.012 | 0.012 |
| චෙක් ජනරජය | 0 | 0 | 0.02 |
| ඩෙන්මාර්කය | 0.24 | 0.47 | 0.57 |
| පින්ලන්තය | 0.09 | 0.13 | 0.37 |
| ප්‍රංශය | 0.05 | 0.05 | 0.06 |
| ජර්මනිය | 0.08 | 0.2 | 0.35 |
| ග්‍රීසියද | n.a. | 0.17 | n.a. |
| හන්ගේරියාව | 0 | 0.1 | 0 |
| අයර්ලන්තය | 0.03 | 0.04 | 0.05 |
| ඉතාලිය | 0.17 | 0.2 | 0.24 |
| ලක්සම්බර්ග් | 0.05 | 0.09 | 0.09 |
| නෙදර්ලන්තය | 0.1 | 0.18 | 0.23 |
| සර්බියාව | 0 | 0.06 | 0.1 |
| ස්පාඤ්ඤය | 0.006 | 0.006 | 0.03 |
| ස්වීඩනය | 0.3 | 0.5 | 1.0 |
| බ්‍රිතාන්‍යය | 0.015 | 0.016 | n.a. |

මූලාශ්‍රය : ලෝක බැංකුව විසින් 2016 ජනවාරියේදී පළකළ "The Refugee Surge in Europe: Economic Challenges" ප්‍රකාශනය

නව ලිබරල්වාදය විසින් ප්‍රාග්ධනය ගලා යාම වෙනුවෙන් ඇති බාධක ඉවත් කරන ලෙස බලකර සිටියද ශ්‍රමය සම්බන්ධයෙන් අනුගමනය කළේ එහි ප්‍රතිවිරුද්ධයයි. ශ්‍රමයට නිදහසේ සංක්‍රමණය වීමට කිසිදු අවකාශයක් ලබා නොදුන් අතර ආගමන නීති රීති තව තවත් දැඩි කළේය. එය නව ලිබරල්වාදය තුළ පැවති එක් ජුගුප්සාජනක පැතිකඩකි. නව ලිබරල්වාදය විසින් තම රටවලට නිදහසේ ශ්‍රමය සංක්‍රමණය නොවීම වෙනුවෙන් පවත්වාගෙන ආ ප්‍රතිපත්තීන් 2014 සිට නොකඩාවම වෙමින් පවතින මහා මිනිස් සංක්‍රමණයන් සමඟ බරපතල ලෙස අර්බුදයට ගමන් කරන්නට විය. යුරෝපයේ සෑම රටකම දක්ෂිණාංශිකයින් හා අන්ත දක්ෂිණාංශිකයින් හිස ඔසවන්නට විය.

ඒ ඒ රටවල ජනගහණයෙන් ලක්ෂයකට ලැබුණු අයදුම්පත් ගණන ගත්විට පිළිවෙලින් හංගේරියාව, ස්වීඩනය, ඔස්ට්‍රියාව යන රටවලට අයදුම්පත් 1799, 1667 හා 1027ක් බැගින් ලැබී ඇත. ජනගහණයේ අනුපාතයට වැඩිම රැකවරණ පතන්නන් අයදුම් කර ඇත්තේ එම රටවලටයි. බ්‍රිතාන්‍ය සම්බන්ධයෙන් ගත් කළ එරට ජනගහණයෙන් ලක්ෂයකට අයදුම් කර ඇත්තේ 60ක් පමණි. ඇතුළුවීමට ඉඩ ලබාදුන් මුළු ගණන ගත්විට පිළිවෙලින් ජර්මනිය, ස්වීඩනය, ඉතාලිය හා නෙදර්ලන්තය 140910, 32215, 29615, 20630 ලෙසින් අවසර ලබාදී ඇති අතර බ්‍රිතාන්‍ය අවසර ලබාදී ඇත්තේ 13905කට පමණි. රැකවරණ පතා ආ අයට කරන්නාවූ වියදම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත්විට ස්වීඩනය, ඩෙන්මාර්කය, පින්ලන්තය, ජර්මනිය හා ඔස්ට්‍රියාව යන රටවල් පහ ඉදිරියෙන් සිටින අතර 2015දී බ්‍රිතාන්‍ය විසින් රැකවරණ පතා ආ අයට කළ වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.016%ක් පමණි. මේ අනුව යුරෝපයේ සංක්‍රමණික ගැටළුව අඩුවෙන් බලපෑ රටක් වූයේ බ්‍රිතාන්‍යයි. එහෙත් යුරෝපා සංගමයෙන් ඉවත්වීම වෙනුවෙන් පැවති ජනමත විචාරණයේදී එය තීරණාත්මක සාධයක් ලෙසින් දක්ෂිණාංශිකයින් විසින් ඉදිරියට ගන්නා ලදී.

2008-2009 හා නැවත 2012 ඇතිවූ ගෝලීය ආර්ථික අවපාතයන්ගෙන් ගැලවී ගැනීමට යුරෝපා සංගමයට හෝ සමස්ත ධනපති ක්‍රමයට හෝ මේ දක්වා හැකිවී නැත. ඇත්තෙන්ම 2008 සිට මේ දක්වා කාලය යුරෝපා සංගමය ඇතුළුව සියළුම දියුණු ධනපති රටවල ආර්ථික වර්ධන වේගයන් ඉතා පහළ මට්ටමක පවතී. 2015දී බ්‍රිතාන්‍ය වර්ධන වේගයේ පහළ යාමක් නැවත වරක් දක්නට ලැබුණි. මේ අතර පසුගිය කාලය තුළ බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂය තුළ සැළකිය යුතු මට්ටමක වාමගාමී වර්ධනයක් ඇතිවිය. දශක ගණනාවක් පුරා බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂයේ නායකත්වය ඩැහැගෙන සිටියේ අන්ත දක්ෂිණාංශිකයින්ය. 2015 සැප්තැම්බරයේ එඩ්වඩ් මිලිබෑන්ඩ් බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂයේ නායකත්වයෙන් ඉවත්වීමෙන් පසු සාපේක්ෂ වාමගාමී ජෙරමි කෝබින් එහි නායකත්වයට පත්වීම එරට ධනපති පන්තිය මෙන්ම කම්කරු පක්ෂයේ දක්ෂිණාංශිකයින්ද පුදුමයටත් භීතියටත් පත් කළේය. 2015 සැප්තැම්බරයට පෙර ජෙරමි කෝබින් කම්කරු පක්ෂයේ නායකත්වයට පත්වනු ඇතැයි කිසිවකුත් විශ්වාස නොකළේය. එහෙත් ඔහු බ්‍රිතාන්‍ය දේශපාලන ඉතිහාසයේ ඕනෑම දේශපාලන නායකයෙක් ලද විශාලතම වරම ලබමින් නායකත්වයට පත්විය. මෙම පරිවර්තනයත් සමඟ දස දහස් ගණන් නව සාමාජිකයන් කම්කරු පක්ෂයේ සාමාජිකත්වය ලබා ගන්නට වූ අතර කම්කරු පක්ෂයට අනුබද්ධ වෘත්තීය සමිති දැඩි ලෙසින් ඔහු වටා එක්රොක් වන්නට විය. බ්‍රිතාන්‍ය තුළ ආර්ථික වර්ධන වේගයේ පහළ වැටීමත් සමඟ ජනතාව වාමගාමී වීමේ ලක්ෂණ මතුව තිබීම නිසා එරට දක්ෂිණාංශිකයින් දැඩි ලෙස කැළඹී තිබුණි. පැවති ජනමත විචාරණයේදී දක්ෂිණාංශිකයින් විසින් සංක්‍රමණික ගැටළුව ඉදිරියට ගනු ලැබුවේ වාමගාමී වෙමින් පැවති ජනතා බලවේග වෙනතකට යොමු කිරීම වෙනුවෙනි. ජනමත විචාරණය අවසන් වූ වහාම කම්කරු පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමේ දක්ෂිණාංශිකයින් විසින් ජෙරමි කෝබින්ට එරෙහිව විශ්වාසභංගයක් ගෙන ලැබුවේද එකී දක්ෂිණාංශික වුවමනාව වෙනුවෙනි. ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කම්කරු පක්ෂය තුළ ඇතිවන වර්ධනයන් එරට මෙන්ම සමස්ත ලෝකයේම ප්‍රගතිශීලී ජනයාට තීරණාත්මක වනු ඇත.

බ්‍රිතාන්‍ය යුරෝපා සංගමයෙන් ඉවත්වීමට තීරණය කිරීම මගින් පෙන්වා සිටින්නේ ධනපති ක්‍රමයට කිසිඳු ලෙසකින් තම මූලික ප්‍රතිවිරෝධයන් යටපත් කිරීමට නොහැකි බවයි. ප්‍රාග්ධනයේ ගෝලීයකරණයක් වෙනුවෙන් මොරදෙන මොවුන්ට එසේ ප්‍රාග්ධනයේ ගෝලීයකරණය හරහා ඇතිවන ගෝලීය නිෂ්පාදන ක්‍රමය පවත්වා ගැනීම වෙනුවෙන් අවශ්‍ය දේශපාලන ව්‍යුහයක් ගොඩනඟාගැනීමට අසමත්ව ඇත. මේ තුළ වටයෙන් වටය අර්බුද කරා ගමන් කිරීමත් ඒ තුළ බිලියන ගණන් ජනතාව දුර්භාග්‍ය කරා ඇද දැමීමත් නැවැත්වීමට ධනපති ක්‍රමයට කිසිඳු හැකියාවක් නොමැත. ධනපති ක්‍රමය විසින් ජනතාව දුර්භාග්‍ය කරා ඇද දැමීම නවතාලිය හැක්කේ මෙම ක්‍රමය වෙනස් කිරීමෙන් පමණි.

'සාධාරණය' සඟරාව කියවන්න